

6

# සලාත් වර්ග

ඉස්ලාමයේ අති උතුම් ම නැමදුම සලාතය යි. මෙයින් අල්ලාහ් සහ මිනිසා අතර තිබෙන සම්බන්ධය දැඩිවේ. සලාතය ඉටු කරන අවස්ථාවේ දී මිනිසා තම හිමි වන අල්ලාහ් සමඟ කතා කරයි. මිනිසා පාපී ක්‍රියාවලින් පිරිසිදු කරන මෙම උතුම් වගකීම කෙරෙහි අප වැඩි අවධානයක් යොමු කළ යුතු ය.

සලාතය ඉස්ලාමයේ විවිධ පදනමින් හා විවිධ වර්ග වශයෙන් බෙදා සැලකේ. සලාතය ඉටු කිරීම කෙරෙහි ඇති වගකීම හා එය ඉටු කරන ආකාරය යන්න එම පදනම් දෙක වේ.

'වගකීම' යන පදනමින් සලාත් වර්ග

## 1. ෆර්ලු

### 1. ෆර්ලු අයින්

සෑම මුස්ලිම් භක්තිකයකු ම අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු සලාත මෙයින් දැක්වේ. මෙය ඉටු නොකළහොත් ඔහු පාපී පුද්ගලයකු වශයෙන් සලකනු ලබන්නේ ය.

- පස්වේල් නැමදුම් වන සුබ්හු, ලුහර්, අසර්, මහ්රිබ් හා ඉෂා
- ජුමුආ සලාත
- භාර වූ සලාත වේ.

### 2. ෆර්ලු කිෆායා

ප්‍රජාවගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් මෙම වගකීම ඉටු කිරීමට ඉදිරිපත් විය යුතු ය. නැතහොත් සියල්ලෝ ම පාපීන් වශයෙන් සලකනු ලබති.

උදාහරණය ඃ ජනාසා සලාතය -. (අභාවයට පත්වූ කෙනෙකු වෙනුවෙන් ඉටු කරනු ලබන සලාතය.)

# 2. සුන්නත්

සියලු සුන්නත් සලාත ඒවායේ ස්වභාවය, ඒවා ඉටුකරන ආකාරය, ඒවා ඉටු කළ යුතු කාලවේලාවන් යනාදිය පදනම් කරමින් ආකාර තුනක් වශයෙන් ඇතුළත් කර සලකනු ලැබේ.

අ) සුන්නා මුඅක්කදා - සුන්නාහ් කයිරු මුඅක්කදා
ආ) රාතිබා කයිරු රාතිබා
ඉ) ජමාඅත් වශයෙන් ඉටුකළ හැකි - ජමාඅත් වශයෙන් ඉටු කළ නොහැකි.

## අ) සුන්නා මුඅක්කදා -----. සුන්නාහ් කයිරු මුඅක්කදා

### 1. සුන්නා මුඅක්කද ඃ

මේවා අවධාරණය කරන ලද සුන්නත් වූ සලාතයන් වේ. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ මේවා නොකඩවා අඛණ්ඩව ඉටු කළහ.

උදාහරණය ඃ සුබ්හු සලාතයට පෙර 2, ලුහර් සලාතයට පෙර 2 යි, පසුව 2 යි. මග්රිබ් සලාතයට පසුව 2, ඉෂා සලාතයට පසුව 2 යි. විත්ර්, ඊද් සලාතය, ග්‍රහණ සලාතය.

### 02. සුන්නා කයිරු මුඅක්කද ඃ

මේවා අවධාරණය නොකරන ලද සුන්නත් වූ සලාත් වේ. මේවා වැඩි ඵල ගෙන දෙන කුසල වේ. මේවාට වර්ග රාශියක් අඩංගු ය.
උදාහරණය ඃ ෆර්ල් වූ පස්වේල් සලාතයට පෙර හා පසුව ඉටු කරන ඉතිරි රක්අත් 12 "තහියියතුල් මස්ජිද්" (මස්ජිදයට ඇතුළු වූ විට එහි වාඩි වීමට ඉටු කරන රකාඅත් දෙකක සලාතය,) වුලූඃ කළ විගස කරන සුන්නත් සලාතයයි.

## ආ) රාතිබත්තු - කයිරු රාතිබත්තු

### 01) රාතිබා වු සුන්නත්.

මේවා දිනපතා ඉටු කළ හැකි සුන්නත් වූ සලාත වේ.
උදාහරණඃ
⋆ තහජ්ජත් සලාතය.
⋆ විත්ර් සලාතය.
⋆ ලුහා සලාතය.

### 02) කයිරු රාතිබ් වූ සුන්නත්

මේවා දිනපතා ඉටු නොකරන සුන්නත් වූ සලාතය වේ.
උදාහරණ:

★ සලාතුල් ඊදයින් - ඊද් දින සලාත (ඊද් උල් අල්හා / ඊද් උල් ෆිත්ර්)
★ සලාතුල් කුසූෆයින් - ග්‍රහණ සලාතය. (සූර්ය / චන්ද්‍ර)
★ සලාතුල් ඉස්තිස්කා - වර්ෂාව පතා ඉටු කරන සලාතය.

### ඇ) ජමාඅත් වශයෙන් ඉටු කළ හැකි - ජමාඅත් වශයෙන් ඉටු කළ නොහැකි.

පොදුවේ ගත් කල සලාත් ජමාඅත් ලෙස ඉටු කළ යුතු සහ තනිව ඉටු කළ යුතු වශයෙන් දෙආකාරව වෙන් කළ හැකි ය. ඒවා පහත අයුරින් බෙදා දැක්විය හැකි ය.

| ජමාඅත් වශයෙන් ඉටු කළ හැකි සලාත | ජමාඅත් වශයෙන් ඉටු කළ නොහැකි සලාත |
|---|---|
| ● පස්වේල් ෆර්ල් සලාත | ● රාතිබත් වූ සුන්නත් සලාත |
| ● ජුමුආ සලාත | ● විත්ර් |
| ● ඊද් දින සලාත | ● තහජ්ජත් සලාත |
| ● ග්‍රහණ සලාත | ● තහියියතුල් මස්ජිද් |
| ● තරාවීහ් සලාත | ● ලුහා |
| ● ජනාසා සලාත | ● සලාතුල් ඉස්තිහාරා |
| ● රමළාන් මස විත්ර් සලාත | ● සලාතුල් හාජා |
| ● වර්ෂාව පතා ඉටු කරන සලාත | ● වුලූඃ කළ පසු ඉටුකරන |

ඉහත සලාත අතරින් ජුමුආ සලාතය අනිවාර්යයෙන් ම ජමාඅත් ලෙස ඉටු කළ යුතු සලාතයකි.

පොදුවේ මේ සියල්ල ම අපට අසීමිත යහපත ගෙන දෙන්නේ ය. තව ද ඒවා අපගේ පාපයන් ඉවත් කිරීමටත් හේතුවක් වන්නේ ය. එසේ ම අප ස්වර්ගයට කැඳවාගෙන යෑමටත් ඒවා හේතු වන්නේ ය.

එම නිසා අප ෆර්ල් වූ සලාතය නියමිත වෙලාවට අප අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු අතර සුන්නත් වූ සලාත ද නොසැලකිලිමත් ලෙස නොසලකා හැර අපට හැකි පමණින් ඉටු කර අල්ලාහ්ගේ සමීප භාවය සහ ආදරය හිමිකර ගැනීමට වෑයම් කළ යුතු ය.

පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන

فَرْضُ عَيْنٍ   فَرْضُ كِفَايَةٍ   رَاتِبٌ   نَفْلٌ   أَبْعَاضٌ   ضُحَى   مُؤَكَّدَةٌ

صَلَاةُ الحَاجَةِ   صَلَاةُ الْكُسُوفَيْنِ   صَلَاةُ الْإِسْتِسْقَاءِ   وِتْرٌ   صَلَاةُ الْعِيْدَيْنِ   تَحَجُّدٌ

**අභ්‍යාස**

පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1.පහත සලාත ෆර්ල් සුන්නා වශයෙන් වර්ග කරන්න.

1. ජුමුආ සලාතය
2. බාරවීමේ සලාතය
3. උත්සව දින සලාතය
4. ෆජ්ර් සලාතය
5. ග්‍රහණ සලාතය
6. ලුහා සලාතය

2. අනිවාර්යයෙන් ම ජමාඅත් වශයෙන් ඉටු කළ යුතු සලාතයක් සඳහන් කරන්න.
3. ජමාඅත් වශයෙන් ද තනිව ද ඉටු කළ හැකි සලාත දෙකක් සඳහන් කරන්න.
4. දිනපතා ඉටු කළ හැකි සුන්නත් වූ සලාත පහක් ලියන්න.
5. පස්වේල් සලාතයට පෙර හා පසුව ඉටු කළ යුතු රාතිබ් වූ සුන්නත් ලැයිස්තු ගත කරන්න.